

# වජිර ඒකනායක

සේයාරුව
**යූ ඩී පෙරේරා**

## ඩී බී කුරුප්පු



පුද්ගලයන් ගැනත් ඔවුන්ගේ අදහස් හා පොත් ගැනත් ලියා ඇති තරම් බැණුම් අසා ඇති මම පුද්ගලයන්ගේ හොඳ පැත්ත පමණක් පෙන්වන පොතක් කලකට පෙර ලියා පළ කළෙමි. ඒ "සංසාර ගමන" නමින් මා රචනා කළ චරිත විග්‍රහ තුන හතරක් ඇතුළත් පොත ය.

මෙවර ද මා ලිවීමට අදහස් කළ පුද්ගලයා මට මුණගැසුණු දිනයත් මගෙන් ඇසූ ප්‍රශ්නයත් මට අද වාගේ මතක ය. වසර 1996 මැද හරියේ දිනයකි. මා සමග එකට ජාතික කළමනාකාරීත්ව ආයතනයේ සේවය කළ ශ්‍රියානි මංචනායක අප පවුලේ සියලු දෙනාටම රාත්‍රි භෝජනය සඳහා හැලම්හි පදිංචිව සිටි බන්දු දිසානායකගේ නිවසට එන්නැයි ආරාධනා කළා ය. ඇය සිය සැමියා සමග සිඩ්නි නගරයේ සිට පැමිණ සිටියා ය.

මා බන්දු දිසානායක නොදන්නා බව කී විට ඇය මට දැනුම් දුන්නේ ඩැන්ඩිනොන් පන්සලට ඇවිත් ඔහු මුණගැසිය හැකි බව ය. මම එවකට හෙන්ඩි වීදියේ තිබුණු පන්සලට ගිය විට එහි සිටි එල් බී ඒකනායක මට බන්දුව හඳුන්වා දුන්නේ ය. බන්දුට පසු එල් බී මට හඳුන්වා දුන් අනෙක් පුද්ගලයා වජිර ඒකනායක ය. මා පොත් ලියන බව එල් බී පැවූ විට වජිර මගෙන් ඇසූ ප්‍රශ්නය මට හිතට ඇල්ලුවේ නැත.

"ආගමේ පොත් ද?"

ආගම ගැන ශ්‍රද්ධාව ගැන කියන කාට වුණත් මගෙන් ලැබෙන ලංසුව ඉතාම පහළ එකකි. එය මගේ අත්දැකීම් අනුව මා පුරුදුකරගත් ලකුණු දැමීමේ ක්‍රමය ය. වජිර ගැන මට අසන්නට ලැබුණු තවත් කතාවක් නිසා මගේ ලංසුව වැඩි කිරීමට මට ඉඩක් නොවී ය.

මගේ පරණ හිතවතකු වූ වෙස්ලි විද්‍යාලයේ ආචාර්යවරයකු වූ -කුවේණි නාට්‍යයේ දඩය-ක්කරු - ෆිලික්ස් ප්‍රේමවර්ධන මෙල්බර්න් නුවරට පැමිණිඅවස්තාවේ මට හමුවූ කල්හි

වජිර ගැන ලිවීමට මා තීරණය කළේ මේ පරණ කතන්දර කියා පාඨකයා සෙහෙසට පත් කිරීමට නොව අභාවප්‍රාප්ත වජිර ඒකනායක විසින් පළ කරන ලද සුපිරි ලක්ෂණ කිහිපයක් ඉස්මතු කර පෙන්වීමට ය. ඔය ඔහුට කරන උපහාරයකට වඩා ඔහුගෙන් අපට ලද හැකි ආදර්ශ හෙවත් උගත හැකි පාඩම් ඇති බව පෙන්වා දීමට ය.

දෙපා නැතිව හාස්කම් කරන පුද්ගලයන් ගැන අපි අසා ඇත්තෙමු. පසුගිය දිනෙක ශ්‍රී ලංකාවේ පුවත්පතක පළ වූ ඡායාරූපයක් විය. එය දෑත් දෙපා විරහිත දැරියකගේ ඡායාරූපයකි. පාසල් ගොස් එක් පාදයක ඉතිරි වූ කොටසින් පෑනකින් ලියන ලියන ඇය පන්තියේ අනෙක් සිසුන් සමග හරි හරියට වැඩ කරන බවද ඒ විස්තරයේ දැක්විණි.

ඒ දැරියට තිබුණ ආකාරයේම අධිෂ්ඨානයක් ඇතිව දෙපා අහිමි තැනට වැටී රෝහල් ගතව සිටි වජිර වෙතින්ද පළ වූ බව මට කීවේ ඔහුගේ මිතුරකු වූ විජය කරුණාසේන ය. මගේ පොත් එළිදැක්වීම් එකකට හෝ දෙකකට පැමිණි වජිර මට කලකින් මුණ ගැසුණේ ද නැත. එහෙත් මම ඔහුගේ වැඩ කටයුතු පිලිබඳව දැන සිටියෙමි. මට දැනගැනීමට ලැබුණෝය.

ඔහුගේත් වජිරගේත් ඥාති සම්බන්ධය ගැන දැනගැනීමට ලැබීම නිසා වජිර කෙරෙහි පැවති මගේ ආකල්පය හෙමිහිට වෙනස්වීමට පටන් ගත්තේ ය.

ඇමරිකාවේ පදිංචි හද්‍රජි මහින්ද ජයතිලක ගේ මිතුරකු වූ වජිරගෙන් මට ඔහුගේ පොතක්ද ලැබුණ බව මට මතක ය. එහෙත් හද්‍රජි මෙහි පැමිණි විට මට ඔහු මුණගැසීමට වුවමනා වූයේ නැත.

විජය සහ හිමාලි කරුණාසේන යුවල වජිරගේ සමීප මිතුරන් බව දැන ගැනීමද මගේ ලකුණු මට්ටම ටික ටික ඉහළ නැංවීමට හේතු වූ බව කිව යුතුය.

රතු කුරුස සමාජය ඇතුළු ඩැන්ඩිනොන් ප්‍රදේශයේ සමාජ සංවිධාන ගණනාවක ක්‍රියාකාරී සාමාජිකයකු වූ ඔහු සංවිධාන කීපයකම මුල් තැන ගෙන කටයුතු කළ බව මම දනිමි. ඔස්ට්‍රේලියා ශ්‍රව්‍ය දෘෂ්‍ය කලා සංගමය ඒ අතරින් මුල් තැනක් ගත්තකි. එමගින් ඩෙස-"මන් කෙලීගේ සංයුක්ත තැටියක් සඳහා කරන ලද පරිත්‍යාගය එක් වැදගත් කාර්යයකි. ලේ දන්දීමේ ව්‍යාපාර පැවැත්වීම අනෙක් සමාජ සේවාව වශයෙන් හැඳින්විය හැකි ය. ශ්‍රී ලංකා නිදහස් දින උළෙලට සහභාගි වීමද සංගමයේ වැඩ සටහනට අයත් වූ බව පෙනෙයි. ඩැන්ඩිනොන් ප්‍රදර්ශන භූමියේ පැළ වගා කිරීමද වජිරගේ සිරිතක්ව පැවති බව පෙනෙයි. මෙරට පුරුදු අසල්වැසියා විපරම නම් සංවිධා-නයේ පත්‍රිකා බෙදා හැරීමට ඉදිරිපත් වීමටද

**සිය දිවිය මිනිස් වග වෙනුවෙන් - සමාජය වෙුනවෙන් කැප බල පුද්ගලයකු මම අභාවප්‍රාප්ත වජිර ඒකනායක තුළ දකින්නේමි**

වජිර පසුබට නොවීය. මොනෑෂ් වෛද්‍ය මධ්‍යස්ථානයේ පැවැත්වෙන සායන සංවිධානය කිරීමද වජිරගේ වැඩ කටයුතු වලට අයත් වූ තවත් අංගයකි.

ශානක ප්‍රනාන්දු විසින් මෙල්බර්න් නුවරට හඳුක්වා දෙන ලද සුවිශේෂ ව්‍යාපෘතියක් වන හිතපුරා අනුභව කොට කැමති ගාණක් දී හෝ නොදී හෝ පිටව යාමට ඉඩ ඇති ආපන ශාලාවකට මා කැඳවාගෙන ගිය විජය කරුණාසේන වජිර විසින් එතැන පවත්වන ලද ඔහුගේ උපන්දින සංග්‍රහයක් ගැනද සඳහන් කළේ ය. මස් මාලු නොකන වජිර ඒ ආකාරයේම රසවත් බොජුන් සහිත සංග්‍රහයක් සිය හිතවතුන් වෙනුවෙන් පිරිනමන ලද බව කී විට මට එක්වරම මතක් වූයේ ශ්‍රී ලංකාවට වැඩම කර සිටි සෝම හිමියන්ට එළවළු පමණක් සහිත දා-නයක් පිරි නැමූ මගේ හිතවතාට ලැබුණු ප්‍රතිචාරයයි. ඔහුගේ නම නොකියා සෝම හිමියන්ට ඒ දානය හිතට නොඇල්ලූ බව පමණක් කියමි.

තමාට රිසි දෙයක් කන බොන එක ගැන දොසක් කීමට කෙනෙකුට අයිතියක් නැති බව මට හිතෙයි. එහෙත් වජිරගේ නිර්මාශ ආහාරය ඔස්සේ ඔහුගේ හදවතට එබී බැලීමට මට හැකි බව මට කිව හැකි ය.

මුල දී මා තුළ හටගත් අදහස් වෙනස්කරගත් මම සිය දිවිය මිනිස් වග වෙනුවෙන් - සමාජය වෙනුවෙන් - කැප කළ පුද්ගලයකු අභාවප්‍රාප්ත වජිර ඒකනායක තුළ දකින්නෙමි. ඔහුට නිවන් සුව පැතීම මගේ රාජකාරියක් නොවේ.

RESIDENTIAL DESIGNS,PERMIT DRAWINGS
RANJ DESIGN & DRAFTING SERVICES
RANJITH WANNINAYAKE
B.Sc(BE), M.Sc(Arch), AIA(SL),Dip Interior (NSW)
Registered Building Practitioner DP-AD 43423
Member of the Building Designers Association of Victoria 3862
Chartered Architect (SL A0476)
20 years exp.
- FREE ADVICES/ FREE QUOTES
- PLANS-SINGLE/DOUBLE STOREY/ EXTENSIONS/DECKS/CARPORTS
- PLANNING PERMIT DRAWINGS
- BUILDING PERMIT DRAWINGS
REGISTERED Building Practitioner
3/19 Balmain Court, Lalor Vic 3075
Tel 0430 066 241 Email:designrake@gmail.com
Web: www.ranjdesigndrafting.com.au